# රාජ්‍ය දැව සංස්ථාව

## වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

රාජ්‍ය දැව සංස්ථාවේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" සේවා ගණය (HM)

**වැටුප් පරිමාණය** : HM 1-2 - 2016 රු. (81,670 - 2,270×15 = 115,720)

**1.1. තනතුර** : **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු හා නිෂ්පාදන) (HM 1-2)**

**සුදුසුකම්** : (පහත I හෝ II)

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණ / විද්‍යා / කෘෂිකර්මය හෝ ක්ෂේත්‍රයට අදාල වෙනත් උපාධියක්

සමග

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම

සහ

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

II. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

**1.2. තනතුර** : **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (HM 1-2)**

**සුදුසුකම්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂි විද්‍යාව / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණය හෝ වාණිජ ක්ෂේත්‍රයට අදාල උපාධියක්

සමග

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

**1.3 තනතුර** : **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණක)(HM 1-2)**

**සුදුසුකම්** (පහත I හෝ II)

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගිණුම්කරණය / වාණිජ / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය ක්ෂේත්‍රයට අදාල උපාධියක්

සමග

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම.

සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

II. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

## 2. "කළමනාකාර" සේවා ගණය (MM)

**වැටුප් පරිමාණය** : MM 1-1- 2016 රු. ( 53,175 - 10×1,375 - 15×1,910 - 95,575)

**2.1. තනතුර** : **නියෝජ්‍ය කළමනාකාර (මුදල්) (MM 1-1)**

**සුදුසුකම්** (පහත I හෝ II)

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගිණුම්කරණය / වාණිජ්‍යය හෝ අදාල ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

II. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) අතරමැදි මට්ටමේ සුදුසුකම / වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ (CIMA) අතරමැදි මට්ටමේ සුදුසුකම / ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ (CMA) අතරමැදි මට්ටමේ සුදුසුකම / වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) අතරමැදි මට්ටමේ සුදුසුකම් / උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම

සහ

අදාල සුදුසුකම ලබාගත් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) පළපුරුද්දක් ලබා තිබීම

**2.2 තනතුර** : **කළමනාකාර / නියෝජ්‍ය කළමනාකාර (පර්යේෂණ හා පුහුණු) (MM 1-1)**

**සුදුසුකම්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / භෞතික විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

**2.3. තනතුර** : **කළමනාකාර / නියෝජ්‍ය කළමනාකාර (දැව පදම්කිරීම් හා පරීරක්ෂණ) (MM 1-1)**

**සුදුසුකම්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / භෞතික විද්‍යාව / කෘෂිකර්මය / කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

**2.4. තනතුර** : **කළමනාකාර / නියෝජ්‍ය කළමනාකාර (සිවිල් ඉංජිනේරු) (MM 1-1)**

**සුදුසුකම්** (පහත I හෝ II)

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු පිළිබඳ උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

II. ක්ෂේත්‍රයට අදාලව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත් (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

අදාල සුදුසුකම ලබාගත් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**2.5. තනතුර** : **කළමනාකාර / නියෝජ්‍ය කළමනාකාර (මානව සම්පත්) (MM 1-1)**

**සුදුසුකම්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

**2.6. තනතුර** : **කළමනාකාර / නියෝජ්‍ය කළමනාකාර (පාලන) (MM 1-1)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම

**වෙනත් පහසුකම් :**

සේවකයන් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය රක්ෂණ

වාර්ෂික ප්‍රසාද දීමනා

පැමිණීමේ දිරි දීමනාව

නිවාස ණය සහ වෙනත් ණය පහසුකම්

සේ.අ.අ. සහ සේ.භා.අ. සඳහා දායකත්වය

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ විස්තර ඇතුළත් තම අයදුම්පත් සහතිකවල පිටපත් හා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරු ද සමග 2022.12.29 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සභාපති, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් ජාතික / පළාත් රාජ්‍ය සේවා හෝ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාල ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති - රාජ්‍ය දැව සංස්ථාව**